තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

தகவல் அறியும் உரிமைகளுக்கான ஆணைக்குழு

**RIGHT TO INFORMATION COMMISSION**

**(CONSTITUTED UNDER THE ACT, No 12 OF 2016)**

මගේ අංකය / எனது இல / My No: A1036

දිනය / திகதி / Date: 2018.09.28

නම් කළ නිළධාරී,
අධ්‍යාපන ලේකම්,
සුනිල් හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, පැලවත්ත,
බත්තරමුල්ල.

## පූර්ව දැනුම් දීම

1. පහත නම සහ ලිපිනය සඳහන් අභියාචක විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ 32 වගන්තිය යටතේ, 10.09.2018 දින මෙම කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එහි පිටපතක් මේ සමඟ එවමි.
2. ඉහත අභියාචනයෙහි සඳහන් වන්නේ අභියාචක විසින් කරන ලද තොරතුරු ඉල්ලීමට ඔබ ආයතනයේ

   (අ) තොරතුරු නිලධාරි විසින් සහ
   (ආ) නම් කළ නිලධාරි විසින් ප්‍රතිචාර දන්වා නැති බවයි.

3. මේ සම්බන්ධව 2016 අංක 12 දරණ පනතේ 25 වන 28 වන හා 31 වන වගන්ති කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. මේ ලිපිය ලැබී දින 07 ක් තුළ පනතේ 25 වගන්තිය පරිදි

   (අ) ඉල්ලා ඇති තොරතුරු නියමිත ගාස්තු අයකර සැපයිමට
   හෝ
   (ආ) පනතේ 5 වන වගන්තිය යටතේ නිස්චිත වූ හේතු දක්වමින් ඉල්ලීම ප්‍රතික්ෂේප කර යැවීමට කටයුතු කර අභියාචක වෙත පිළිතුරු යවන මෙන් දන්වමි.

   එසේ පිළිතුරු යවනු ලබන ආවරණ ලිපියෙහි පිටපතක් සමග අපගේ යොමු අංකයද සඳහන් කර ඔබ විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගය පිළිබඳ වාර්තාවක් මෙම කොමිෂන් සභාව වෙත එවන මෙන් දන්වමි.

4. ඉහත දැනුම් දීම අනුව කටයුතු කිරිමට ඔබ අපොහොසත් වුවහොත් කොමිෂන් සභාව නියම කරනු ලබන දිනයකදී, අභියාචනය විභාග කිරිමට නොතීසි නිකුත් කරනු ලබන බවද දන්වා සිටිමි.

අභියාචකගේ නම සහ ලිපිනය
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා,
නො 5/1,
එලිබෑන්ක් පාර,
කොළඹ 05.

පියතිස්ස රණසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව

පිටපත : අභියාචක වෙත
ඉහත ලිපිය අනුව දින 10 කින් පසු වාර්තා කිරිමට

අධ්‍යක්ෂ ජනරාල්
කොමිෂන් සභාවේ අණ පරිදි

ලිපිනය : කාමර අංක 203-204 ,බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත කොළඹ 07
விலாசம்: அறை இல 203-204, பிஎம்ஐசிஎச் ,பௌத்தாலோக்க மாவத்தை , கொழும்பு 07.
Address : Room No 203-204, BMICH, Bauddhaloka Mawatha, Colombo 07
දුරකථන/ தொலைபேசி/Telephone : 011 2691625 විද්‍යුත් තැපැල/ மின்னஞ்சல்/ e- Mail : rti.commission16@gmail.com
ෆැක්ස්/ தொலைநகல்/Fax : 011 2691625